**දිවුලපිටිය ප්‍රාදේශීය සභාව - 2020**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1. පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතයට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.9 | මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු සන්සන්දනය කිරීමට පහසුවන ආකාරයට සත්‍ය, අයවැයගත සහ පෙර වූ තුලනාත්මක කාලපරිච්ඡේදයේ සත්‍ය සහ වටිනාකම් අතර යම් ප්‍රමාණාත්මක වෙනස්වීම් සහ ඒවාට හේතු හෙළිදරව් කළයුතු වුවත් එපරිදි කටයුතුකර නොතිබුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී අදාල ආකෘති භාවිත කිරීමට කටයුතු කරමි. | ප්‍රමිතයට අනුකූලව ගිණුම් පිළියෙල කළයුතු වේ. |

### 1.6.2. ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ දේපල පිරියත හා උපකරණ රු.1,019,963,624 ක් සඳහා ක්ෂය ගණනයකර ගිණුම්ගතකර නොතිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය සහ දේපල පිරියත සහ උපකරණ ශේෂය රු.29,511,830 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් සකස්කිරීමේදී තොරතුරු ඇතුලත් කරමි. | ප්‍රමිතයට අනුකූලව ගිණුම් පවත්වා ගතයුතු වේ. |
| (ආ) | ආදායම් කළමනාකරණය සඳහා යොදාගත් එකතු වටිනාකම රු.1,070,000 ක් වූ මෘදුකාංග පද්ධති දෙකෙහි වටිනාකම ප්‍රාග්ධනිතකර නොතිබුණි. | 2021 වර්ෂයේදී නිවැරදි කරමි. | සියළු වත්කම් ප්‍රාග්ධනිත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.193,585,887 ක් වූ ප්‍රාග්ධන ප්‍රදානවලින් වර්ෂයට අදාල වටිනාකම වන රු.19,650,487 ක පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයට ලද ප්‍රාග්ධන ප්‍රදානවලින් වාර්ෂිකව හඳුනාගනු ලබන ප්‍රමාණය 2021 වර්ෂයේ සිට විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරමි. | ගිණුම් නිවැරදිව පිළියෙල කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුල සේවකයන්ගෙන් අයකරගතයුතු ආපදා ණය ශේෂයෙන් පෙර වර්ෂවල සේවකයන්ගෙන් වැඩිපුර අයකරගෙන තිබූ රු.131,572 ක් අඩුකර පෙන්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ සේවක ණය ශේෂය රු.131,572 කින් අඩුවෙන් පෙන්වා තිබුණි. | වැඩිපුර අයකර තිබූ රු.131,572 ක මුදල තැන්පත් ලේඛනයට ගෙන ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | සේවක ණය නිවැරදිව ගැලපීමට කටයුතු කළයුතු වේ. |
| (ඉ) | විමධ්‍යගත කර්මාන්ත ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පරිපාලන වියදම් ලෙස 2016 වර්ෂයේ ලැබී තිබුණු රු.514,000 ක් ආදායමට නොගෙන විවිධ තැන්පත් ලෙස ගිණුම් ගතකර තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමි. | ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඊ) | විමධ්‍යගත කර්මාන්ත ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සභාව විසින් දරන ලද පරිපාලන වියදම් වෙනුවෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද රු.67,368 ක් ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට නිලධාරීන් වෙත ගෙවා තිබුණි. | මෙය ණයගැති ලේඛනයට සටහන් කර ආපසු ගෙවීම සිදු කර ඇති බව දන්වා සිටිමි. | අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |
| (උ) | කළුගල්, බොරළු, කුට්ටිගල් ප්‍රවාහනය සඳහා ප්‍රාදේශීය සභා මාර්ගය භාවිතා කිරීම වෙනුවෙන් අවස්ථා 35 කදී වැඩපලවල් හිමියන්ගෙන් අයකරන ලද රු.305,000 ක් ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට තැන්පතු ලෙස ගිණුම්ගතකර තිබුණි. | ආදායමට ගැනීමට කටයුතු කරමි. | ආදායම් ලෙස හඳුනාගැනීමට කටයුතු කළයුතු වේ. |

1.6.3. **ලැබිය යුතු හා ගෙවියයුතු ශේෂ**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කර්මාන්ත ණයගැතියෝ වටිනාකම මූල්‍ය | මෙම වෙනස්කම් වසර ගණනාවක සිට පැවත එන්නක් වේ. දැනට ඇති ලේඛණ | වෙනස්කම් සොයා බලා මූල්‍ය ප්‍රකාශන නිවැරදි |

| | | |
|---|---|---|
| ප්‍රකාශන අනුව රු.105,871,063ක් සහ උපලේඛනය අනුව රු. 136,958,722ක් වූයෙන් රු. 31,087,659 ක වෙනසක් වූ අතර, ණයගැති ශේෂය තුල අයවීම් හිග හිටි වර්ෂ 1 – 3 ත් අතර රු.8,724,548 ක් හා වර්ෂ 01 ට අඩු රු.97,146,478 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සහ මුදල් පොත් පරීක්ෂා කිරීමේදී අවසන් ගිණුමට ලබා දී ඇති තොරතුරු සාවද්‍ය වේ. තවදුරටත් මේ පිළිබඳව පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු කරමි.<br>උප ලේඛනය අනුව ණයගැති මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. | දත්ත අනුව පිළියෙල කිරීමටද, අයකර ගැනීම් සඳහාද , කටයුතු කළයුතු වේ.. |

1.6.4. **විගණනය සඳහා අවශ්‍ය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.54,023,294 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | හිග හිටි වෙනත් ආදායම් ලේඛනගත නොවූ ශේෂය, 2019 මූල්‍ය ප්‍රකාශ අනුව රු.36,313,796 වී ඇති අතර එය 2020 මූල්‍ය ප්‍රකාශය පරිදි රු.31,088,000 වේ. ඒ අනුව රු.5,225,796.00 ක මුදලක් ලේඛන ඉදිරිපත් කර නිවැරදිවී ඇත.<br>හඳුනා නොගත් පොදු ගබඩා තොගය 2010 වර්ෂයේ සිට පැවත එන දෝෂයකි. පරීක්ෂා කර බලා ඉදිරි කටයුතු සිදු කරමි. | ලේඛන හා උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.72,591,000 ක් වූ අතර ,ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,962,179 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

2.2.1. **වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට රු.2,582,658 ක වරිපනම් හිඟ ශේෂය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරගෙන යමි. | වරිපනම් බදු අයකර ගැනීමට නීතිමය කටයුතු කළයුතු වේ. |

2.2.2. **කඩ කුලී**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1980 දෙසැම්බර් 31 දිනැති හා අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ කඩ කාමර බදු දීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව, වසර පහකට වරක්වත් තක්සේරුගත බදු කුලිය සංශෝධනය කළයුතු වුවත්, සභාව සතු කඩ කාමර 58 ක් සඳහා එසේ කටයුතු කර නොතිබුණි.<br>2014 වර්ෂයේ සිට බදු දීමට කටයුතු කර නොතිබුණ මාසික කුළිය රු.3,500 ක් වූ කඩ කාමර 05 න් 03 ක් සඳහා රු.150,000 ක තැන්පතු මුදලක් 2020 ජුලි 28 දින ලබාගෙන තිබුණද, ව්‍යාපාරික කටයුතු සඳහා සුදුසු තත්ත්වයට පත්කර දී නොතිබුණි.<br>2020 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.713,505 ක් තුල වසර 1 ට වැඩි රු.97,020 ක් වූ අතර අයකරගෙන නොතිබුණි. | නව තක්සේරු කුලී ලබාදෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යවා නව තක්සේරු කුලී ලබා ගැනීමට කටයුතු කරමි. කඩකාමර 05 කිහිපවරක් ටෙන්ඩර් කලද එම කඩකාමර බදු ලබා ගෙන නොමැත. 2020.07.14 සභාවට මේ පිළිබඳව ඉදිරිපත් කරන ලදුව රු.50,000/- බැගින් තැන්පත් මුදල් අයකර ලබාදීමට තීරණය වී ඇත. ඒ අනුව දිවුලපිටිය සතිපොල භූමියේ ඉහල මාලයේ අංක 17,18,20 සඳහා 2020.07.28 දිනැති ලදුපත් අංක 76526 මගින් රු.150,000 /- අයකර ඇත. හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි | නව තක්සේරු ලබාගෙන ඒ අනුව කුලී අයකිරීම සහ හිඟ කුලී අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1. අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා අරමුදල් රු.1,846,590 ක් යොදවා 2019 දෙසැම්බර් 18 දින වන විට වැඩ අවසන්කර තිබූ වල්පිට තුරු සෙවන භූමියෙහි හෙල බොජුන්හල 2020 දෙසැම්බර් 31 දින වන විටද ආදායම් උත්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමකින් තොරව ඌන උපයෝජිතව පැවතුණි. | වල්පිට තුරු සෙවන භූමියේ හෙල බොජුන්හල බදු දීම සඳහා රජයේ මාසික තක්සේරු කුලිය ලෙස රු.15,250/- ලෙස ප්‍රධාන තක්සේරුකරුගේ 2020.11.16 දින ලිපියක් ලැබී ඇති අතර ඒ අනුව ටෙන්ඩර් මගින් බදු දීමට කටයුතු කරගෙන යමි. | සභා දේපලවලින් ආදායම් ඉපයීමට කටයුතු කළයුතු වේ. |

## 3.2. අත්හැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ (නර්ඩ්) උපදේශකත්වයෙන් 2014 වර්ෂයේදී රු.500,000 ක් වැයකර ජීව වායු ජනකයක් සභා පරිශ්‍රය තුල සකස්කර එය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ සේවකයෙකුට පුහුණුවක්ද ලබාදී තිබූ නමුත් ජීව වායු ඒකකයට අවශ්‍ය නල එළීම සඳහා සුදුසු ස්ථානයක් සභාව විසින් ලබා නොදීම නිසා, නර්ඩ් ආයතනය විසින් එම ව්‍යාපෘතිය ලැයිස්තුවෙන් ඉවත්කර තිබුණි. එම ඒකකය නැවත ප්‍රතිස්ථාපනය කිරීමට පෙර දෝෂ පරීක්ෂා කළයුතු බව 2020 මාර්තු 04 දිනැති නර්ඩ් ආයතනයේ අංක N/NED/COM/02/09/2014/2020-01 දරන ලිපිය මගින් සභාව වෙත දැනුම්දී තිබුණද 2020 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන ව්‍යාපෘතිය අතහැරදමා තිබුණි. | 2020 වසරේ covid වසංගතය නිසා ඇඳිරිනීතිය පනවා තිබූ බැවින් ජීවවායු ඒකකය ක්‍රියාත්මක තත්වයට පත් කර ගැනීමේ කටයුතු අතරමඟ ඇණහිට තිබුණි. | අදාල යටිතල පහසුකම් සපයා ව්‍යාපෘතිය නොපමාව ක්‍රියාත්මක කිරිමට කටයුතු කළයුතු වේ. |